# Submission of Medical Certificates for Lectures & Practical's

01. Name: ……………………………………………………………………………

02. Address: ……………………………………………………………………

03. Contact Number: ………………………………………………………………

04. Registered No. : ……………………………………………………………

05. Academic Year: ………………………………………………………………

06. Level: …………………………………………………………………………

07. Semester and Year: …………………………………………………………

08. Degree Program (ETEC, ICTEC, BTEC): ……………………………………

09. Details of subjects covered by the Medical Certificate:

| Name of Subject | Subject code | Date | Place of Issue | Medical certificate Number |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

**රුහුණ විශ්ව විද්‍යාලීය අභ්‍යන්තර ශිෂ්‍යයින් විසින් වෛද්‍ය හේතූන් මත නොපැමිණීම සම්බන්ධව වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම සඳහා අදාල වන නිර්නායකයන්**

**1 වෛද්‍ය හේතූන් මත උපාධි පරීක්ෂණවලට පෙනී නොසිටීම.**

වෛද්‍ය හේතූන් මත විභාගවලට පෙනී නොසිටීම සම්බන්ධව වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් විධි විධාන අනුගමනය කළ යුතුය.

1. 1 ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික විශ්වවිද්‍යාලීය වෛද්‍ය නිලධාරී හෝ රජයේ ආරෝග්‍ය ශාලාවකින් හෝ විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් විය යුතුය.

1 .2 ඉහත සියලු වෛද්‍ය සහතික රජයේ ආකෘති පත්‍රයක/ලිපි ශීර්ෂ සහිතව නිල මුද්‍රාවක් සහිතව නිකුත් කරන ලද විධිමත් වෛද්‍ය සහතික විය යුතුය.

1. 3 ඉදිරිපත් කරනු ලබන එක් වෛද්‍ය සහතිකයක් උපරිම දින 14ක් දක්වා පමණක් ඉදිරිපත් කළ යුතු අතර වෛද්‍ය හේතූන් මත තව දුරටත් නිවාඩු අවශ්‍ය වන්නේ නම් නැවතත් විධිමත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීම අවශ්‍යවේ.

1. 4 වෛද්‍ය හේතූන් මත යම් ශිෂ්‍යයෙකුට විභාගය සඳහා පෙනී සිටීමට නොහැකි වන්නේ නම් ඒ බව වහාම විදුලි පුවතක් මගින් අදාල පීඨයේ පීඨාධිපතිට /ලේඛකාධිකාරීට/ අදාල පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී හෝ සහකාර ලේඛකාධිකාරී වෙත දැන්විය යුතුය. හැකි ඉක්මණින් අදාල වෛද්‍ය සහතික ඉදිරිපත් කළ යුතු අතර එම කාලය වෛද්‍ය නිවාඩු ආසන්නව පීඨයට වාර්තා කළ දින සිට සතියක් නොඉක්මවිය යුතුය.

**2 දේශනවලට නොපැමිණීම සම්බන්ධයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම.**

යම් ශිෂ්‍යයෙකුට වෛද්‍ය හේතූන් මත දේශනවලට සහභාගී වීමට නොහැකි වීම සම්බන්ධව වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් නිර්ණායක අනුගමනය කළ යුතුය.

2.1 දින 7ක් නොඉක්මවන කාලයක් සඳහා වෛද්‍ය හේතූන් මත දේශනවලට සහභාගී වීමට නොහැකිවීම පිළිබඳව වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේදී ඉහත 1 1 උප වගන්තියෙහි සඳහන් වෛද්‍ය නිලධාරීන් හැරුණ විට වෛද්‍ය සභාවේ ලියා පදිංචි වෛද්‍ය නිලධාරියෙකු (MBBS උපාධිධාරී) හෝ ලියා පදිංචි ආයුර්වේද නිලධාරිවරයෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමට හැකියාව ඇත .

2 .2 දේශනවලට සහභාගී නොවීම සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික සඳහා ද 1.2 සිට 1.4 දක්වා වන උප වගන්ති වල නිර්ණායකයන් අදාල වන අතර එම නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.

**3 වෛද්‍ය හේතූන් මත විශ්ව විද්‍යාල ප්‍රවේශය කල් ගැනීම.**

වෛද්‍ය හේතූන් මත විශ්වවිද්‍යාල ප්‍රවේශය කල් ගැනීම සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේදී පහත නිර්ණායක අනුගමනය කළ යුතුය.

3 .1 යම් ශිෂ්‍යයෙකු වෛද්‍ය හේතූන් මත විශ්ව විද්‍යාල ප්‍රවේශය කල් ගැනීම සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කරන්නේ නම් අඛණ්ඩව හෝ කඩවීම සහිතව එම වෛද්‍ය සහතිකය මගින් අවම වශයෙන් සති 6ක (වැඩ කරන දින 30ක කාලයක් ) කාලයක් ආවරණය විය යුතුය. ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික 1.1 උප වගන්තියේ සඳහන් වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතික විය යුතු අතර 1.2 උප වගන්තියේ සඳහන් නිර්ණායකයන් අනුව ඉදිරිපත් කරන ලද වෛද්‍ය සහතිකයක් විය යුතුය.

**4 වෛද්‍ය සහතික අනුමත කිරීම.**

ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික අනුමත කිරීමේදී පහත ක්‍රියා පිළිවෙත අනුගමනය කළ යුතුය.

4.1 නියමිත කාලය තුළදී ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික විශ්වවිද්‍යා වෛද්‍ය නිලධාරී නොපමාව ඉදිරිපත් කර නිර්දේශ ලබා ගත යුතු අතර සියළුම වෛද්‍ය සහතික වෛද්‍ය නිර්දේශය සහිතව එළඹෙන පළමු පීඨ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අදාල තීරණ ලබා ගත යුතුය.

4.2 විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරී විසින් වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තීරණ ලබා ගන්නා ලෙස නිර්දේශිත වෛද්‍ය සහතික අදාල ශිෂ්‍යයා සමග වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තීරණ ලබා ගත යුතු අතර එම නිර්දේශයන් සඳහා පීඨ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය. 1 .4 වෛද්‍ය සහතික සඳහා ලබා දෙනු ලබන තීරණ ශිෂ්‍යයාට ලිඛිතව දැනුම් දිය යුතු අතර අදාල තීරණයන්හි පිටපතක් එම ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාල අංශය වෙත යැවිය යුතුය.